# <u>විශේෂ මහ සභා රැස්වීම - 2025.06.12 දින</u>
# <u>අලව්ව ප්‍රාදේශීය සභාව</u>

2025.06.12 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ විශේෂ මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**<u>මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා</u>**

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවිර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**<u>මෙදින සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එස්.එම්. යසින්තා සජීවනී සේනාරත්න මැතිනිය

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ විශේෂ මහ සභා රැස්වීමට සපැමිණි ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවිර මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.ජ්. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබනවා.

එමෙන්ම අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් සියළු දෙනාත්, මාධ්‍යවේදී මහතාත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබනවා.

## 01. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

### 01. 1 - සභාවේ ඉදිරි වැඩපිළිවෙල පිළිබඳ දැනුවත් කිරීම

අද විශේෂ මහා සභා රැස්වීම පැවැත්වෙන වේලාවේ වචනයක් හරි ප්‍රකාශ කිරීම උචිතයි කියලා මා සිතුවා. ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා සියලු දෙනාම දන්නවා අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අපේ වසම් 66ක බල ප්‍රදේශය ඒ වගේම අලව්ව නගරය අරගෙන බැලුවත්, ඉතිහාසයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියලුම නගරයන් අරගෙන බැලුවත් ඇත්තටම අලව්ව නගරය ඉතා නොදියුණු මට්ටමක පවතින්නේ. වසම් මට්ටමින් ගත්තත් ඉතා නොදියුණු මට්ටමක පවතින්නනේ. ඉතින් අලව්ව නගරය මේ කියන තැනින් පෙරට අරගෙන එන්න මම ඔබ අප 25 දෙනාගේම සහයෝගය අනිවාර්යෙන් අවශ්‍ය වෙනවා. අපි එකතුව එක පියවරක් හරි ඉස්සරහට ගන්න පුළුවන් නම්, ඒ කාර්යය ඉටු කරන්න පුළුවන් වෙන්නේ අපි හැමෝම එක කණ්ඩායමක් විදිහට වැඩ කළොත් විතරයි. මම නගරයේ තියන දේවල් එකින් එක කියන්න යන්නේ නෑ. ඒක ඔබ තමුන්නාන්සේලා, ඔබ තුමියන්ලා හැමෝම දන්නවා. එවගේම තමයි ප්‍රාදේශීය සභා පරිශ්‍රය ගත්තත් ලංකාවේ මෙච්චර පහසුකම් නොමැති ප්‍රාදේශීය සභාවක් නොමැති තරම්. අද රාජකාරී කටයුතු කරගෙන යන්න අපේ නිලධාරීන්ට ප්‍රාදේශීය සභාවේ ස්ථානයක් නෑ. පාවිච්චි කරන්නේ නගර ශාලාව. අප මත ලොකු වගකීමක් තියනවා. අළුත් ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලක් ඉදි කර ගැනීමට අපි හැමෝම හිතට ගමු. ඒ සම්බන්ධයෙන් මම ඉදිරියේදී කටයුතු කරනවා. හැබැයි මට ඔබ සැමගේ සහයෝගය අවශ්‍ය වෙනවා. ඒ විතරක් නෙවෙයි ග්‍රාම සේවා වසම් 66ක් ගත්තහම භෞතික සම්පත්වල අඩුපාඩුකම් තියනවා. මානව ප්‍රජාව ගත්තහම අපේ ගම්වල ඉන්න ජනතාව බහුතරයක් ඉතා නොදියුණු මානසික මට්ටම්වල ඉන්නේ. ඒ කියන්නේ මේ සමාජය අපේ ඉස්සරහට අරන් යනකොට ඊට සමානවම නොදියුණු සමාජයක් අපේ ඉස්සරහ තියනවා. ආකල්පය වෙනසක් අපේ ජනතාව තුල ඇති කරගන්න ඕනෑ. ඒ සඳහා අපට නොයෙක් වැඩ සටහන් ඉදිරියේදී කරන්න සිද්ධ වේවි. භෞතික සම්පත් දියුණු කිරීම විතරක් නොවේ. මේ සියළු කටයුතු සඳහා මගේ මන්ත්‍රී මණ්ඩලයේ ඔබ සියලු දෙනාගේම සහයෝගය මා ඉදිරියේදී අපේක්ෂා කරමින් න්‍යාය පත්‍රයට යොමු වෙනවා.

### 01.2 - 2026 අයවැය සම්පාදනය

ප්‍රාදේශීය සභා අයවැය සම්පාදන හා බලාත්මක කිරීමේ රීති මාලාවේ 6 (1) වගන්තියට අදාලව 2026 වර්ෂය සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ සකස් කිරීමට යෝජිත අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට සහ සංවර්ධන සැලැස්මට ඇතුලත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා ඇතොත් 2025.06.30 ට පෙර ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම මෙයට අදාල පුවත්පත් නිවේදනය 2025.05.19 දින දිනමිණ, ඩේලි නිවුස්, තිනකරන් යන පුවත්පත්වල ද පල කර තිබෙනවා.

## 02. යථා පරිදි කල් දී ඇති යෝජනා

### (02-1) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/01– 01 දරණ යෝජනාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක් විසින් කරනු ලැබිය යුතු යැයි හෝ ඉටු කරනු ලැබිය යුතු යැයි 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ විධානය කරනු ලැබ ඇති හෝ බලය පවරනු ලැබ ඇති හෝ සියළු විධායක ක්‍රියා කිරිම සහ වගකීම් ඉටු කිරීමේ බලය අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා වෙත පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක් විසින් කරනු ලැබිය යුතු යැයි හෝ ඉටු කරනු ලැබිය යුතු යැයි 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ විධානය කරනු ලැබ ඇති හෝ බලය පවරනු ලැබ ඇති හෝ සියළු විධායක ක්‍රියා කිරිම සහ වගකීම් ඉටු කිරීමේ බලය අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා වෙත පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

### (02-2) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/01 - 02 දරණ යෝජනාව

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයට අදාල මහ සභා රැස්වීම් සෑම මසකම දෙවන සතියේ බ්‍රහස්පතින්දා දින පෙ.ව. 09.30 ට පැවැත්වීමටත්, යම් හෙයකින් එදින නිවාඩු දිනයක් වන අවස්ථාවක පසුදින රැස්වීම් පැවැත්වීම සුදුසු බවත්, ඊට අදාල පහත සඳහන් දින සටහන අනුමත කිරිම සුදුසු බවත් යෝජනා කරමි.

| මාසය | මහ සභාව |
|---|---|
| ජුනි | 26 වන බ්‍රහස්පතින්දා |
| ජුලි | 11 වන සිකුරාදා |
| අගෝස්තු | 14 වන බ්‍රහස්පතින්දා |
| සැප්තැම්බර් | 11 වන බ්‍රහස්පතින්දා |
| ඔක්තෝම්බර් | 09 වන බ්‍රහස්පතින්දා |
| නොවැම්බර් | 13 වන බ්‍රහස්පතින්දා |
| දෙසැම්බර් | 11 වන බ්‍රහස්පතින්දා |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයට අදාල මහ සභා රැස්වීම් සෑම මසකම දෙවන සතියේ බ්‍රහස්පතින්දා දින පෙ.ව. 09.30 ට පැවැත්වීමටත්, යම් හෙයකින් එදින නිවාඩු දිනයක් වන අවස්ථාවක පසුදින රැස්වීම් පැවැත්වීම සුදුසු බවත්, ඊට අදාල ඉහත සඳහන් දින සටහන අනුමත කිරිම සුදුසු බවත් ඒකමතිකව සභා සම්මත විය.

**(02-3) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/01– 03 දරණ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා පහත සඳහන් ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවිර මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
10. පී.ඒ. මහින්ද ධනපාල මහතා, විශ්‍රාමික සහකාර විගණන අධිකාරී, පහළ බුජ්ජොමුව, බුජ්ජොමුව
11. ඩබ්.එම්. ජයතිලක මහතා, විශ්‍රාමික ගණකාධිකාරී, වඩුවාව, යටිගල්ඔළුව
12. ඒ.පී. අමරසිංහ මහතා, විශ්‍රාමික ආදායම් බදු නි. කොමසාරිස්, ගල්ගමුව දකුණ, මහරව්විමුල්ල

**මුදල් ප්‍රතිපත්ති කාරක සභාවට පැවරී ඇති බලතල -**

1. සභා අරමුදලින් කරනු ලබන රු. 2,000,000.00 දක්වා වූ සියළු වියදම් අනුමත කිරීම
2. අලව්ව ප්‍රාදේශීය සභාවේ නව ආදායම් ප්‍රභවයන් හඳුනාගැනීම සහ පවත්නා අදායම් අයකරගැනීමේ ක්‍රමවේදය පිළිබඳව සභාව වෙත යෝජනා ඉදිරිපත් කිරීම
3. වාර්ෂික අයවැය යෝජනා පිළිබඳව නිර්දේශ සභාව වෙත ඉදිරිපත් කිරීම
4. සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනාගැනීම, අළුතින් ඇතිකරගත යුතු තනතුරු හඳුනාගෙන එකී තනතුරු අනුමත කරගැනීමට අදාළ නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
5. ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය සඳහා නිර්දේශ ලබා දීම.
6. කාර්ය මණ්ඩලයේ සුභසාධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම
7. ඒ ඒ විෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන රු. 2,000,000.00 දක්වා වූ ව්‍යාපෘති වාර්තා අනුමත කිරීම
8. මහජන සේවාවන් වඩා කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම සම්බන්ධයෙන් වන නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම
9. බල ප්‍රදේශයේ පුද්ගලික ආයතන වල දායකත්වය සංවර්ධන කටයුතු සඳහා දායක කරගැනීමේ වැඩසටහන් හඳුනාගෙන නිර්දේශ ලබාදීම
10. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියෙන් ලැබී ඇති බලතල අනුව 126 වගන්තියේ සඳහන් විෂයන් සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථා නිර්දේශ කර මහ සභාව වෙත ඉදිරිපත් කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. නමුත් මේ කාරක සභා සඳහා පක්ෂ වශයෙන්වත් අපේ මන්ත්‍රවරු ඇතුලත් වෙලා නෑ. ස්වාධීන කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ගේ නම් ඇතුලත් වෙලා නෑ. එමෙන්ම සමගි ජල බලවේගයේ ජොෂ්ඨ මන්ත්‍රීවරු කීපදෙනෙක්ගේ නම් ඇතුලත් වෙලත් නෑ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ නම් ඇතුලත් වෙලත් නැති

බවයි පෙනී යන්නේ. පොදුවේ පක්ෂ වෙනුවෙන් අපි ජනතාවට වගකියන නිසා ඒ අයව ඉදිරි ඒවාටවත් ඇතුලත් කරගන්නා ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, අපිට ලිඛිතව ඔබතුමන්ලාගෙන් යෝජනා ගන්න පුළුවන්. ගැටළුවක් නෑ. නමුත් කාරක සභා දෙකකට විතරයි ගෙවීම් කටයුතු සිදුවෙන්නේ. දැන් අපි දෙකකට වඩා නම් කලොත් අනෙක් ඒවා සඳහා ගෙවීම් කරන්න වෙන්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙතෙක් මහා සභාව පැවති කාලසීමාවේ මෙම දීමනා බලාගෙන නොවෙයි මහජන නියෝජිතයෝ ආවේ. මෙතන ඉන්න අයගෙන් කැපවීමෙන් එන්න අදහස් කරන සියළු දෙනාගේ නම් ඇතුලත් කරලා අපි මේක සකස් කරමු. පසුව මේ අය දීමනාවක් ගැන විමසීම් කරන්නෑ කියලා මම විශ්වාස කරනවා. කමිටු දෙකකට ගෙවන එක ප්‍රශ්නයක් නෑ. ඒක කාටත් පොදුවේ ගෙවනවා.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා ඉහත ඉදිරිපත් කල සංයුතියට අමතරව ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් පරිදි පහත නම් ඇතුලත් කොට සංයුතිය සකස් කර සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඉහත සංශෝධන වලට යටත්ව එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා ඉහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(02-4)** <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක **07/01 – 04** දරණ යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා පහත සඳහන් ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා

11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
12. එල්.එල්.ඒ.සී.එස්.කේ. ගුණවර්ධන මහතා, විශ්‍රාමික නි.අධ්‍යාපන අධ්‍යක්ෂ, කුසුමිත,යත්තල්ගොඩ, නවතල්වත්ත
13. ගුවන්ත ගංගාධර මහතා, ඖෂධවේදී, වල්පොල, ඉහළ වලකුඹුර, අලව්ව
14. එම්.පී. උපුල් ජයම්පති මහතා, කෘ.ප.නි.ස., රජ මාවත, පරමාඋල්ල, අලව්ව

<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවට පැවරී ඇති බලතල -</u>

1. සභාව විසින් සපයනු ලබන සේවාවන්ට අදාළව සියළු අංශ මගින් සකස් කරනු ලබන ආංශික සැලසුම්, වාර්ෂික සංවර්ධන සැලසුම් සහ සිව් අවුරුදු සැලසුම් නිර්දේශ කර මහ සභාවට ඉදිරිපත් කිරීම
2. බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පුරවැසියන් සඳහා අයවැය ප්‍රතිපාදන මත අවශ්‍ය වැඩසටහන් සැලසුම් කර සභාව වෙත ඉදිරිපත් කිරීම
3. අයවැයෙන් වෙන් කළ ප්‍රතිපාදන මත ආගමික වැඩසටහන්,අධ්‍යාපන වැඩසටහන්, සාහිත්‍ය වැඩසටහන් හා සංස්කෘතික වැඩසටහන් සැලසුම් කර මහ සභාවට ඉදිරිපත් කිරීම.
4. බල ප්‍රදේශයේ විශේෂ හැකියා සහිත පුද්ගලයින් හඳුනාගෙන ඔවුන් වෙනුවෙන් වැඩසටහන් සැලසුම් කර මහ සභාවට ඉදිරිපත් කිරීම
5. සභාව සතු පුස්තකාල, පෙර පාසල්, ආයුර්වේද සංවර්ධනය වෙනුවෙන් වූ නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
6. බලප්‍රදේශයේ බරපතල රෝගාබාධවලින් පෙලෙන පුද්ගලයන්ට හා ආපදාවලට පත්වූ අයට සහන සැලසීම සඳහා වන නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
7. බල ප්‍රදේශයේ ක්‍රීඩා සංවර්ධනය සඳහා වන නිර්දේශයන් මහ සභාව වෙත ඉදිරිපත් කිරීම
8. බලප්‍රදේශයේ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වූ නිර්දේශයන් මහ සභාවට ඉදිරිපත් කිරීම
9. බල ප්‍රදේශයේ ළමා තරුණ හා වැඩිහිටි ප්‍රජාවන් සඳහා වූ වැඩසටහන් සඳහා නිර්දේශ ලබා දීම
10. බල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා නිර්දේශ ලබාදීම
11. බල ප්‍රදේශයේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වූ නිර්දේශ ලබාදීම
12. බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ජංගම වැඩසටහන් පැවැත්වීම ආදිය සම්බන්ධ නිර්දේශ ලබා දීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. එමෙන්ම නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා ඉහත ඉදිරිපත් කල සංයුතියට අමතරව ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් පරිදි පහත නම් ඇතුලත් කොට සංයුතිය සකස් කර සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

1. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඉහත සංශෝධන වලට යටත්ව එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ

අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා ඉහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(02-5) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/01 – 05 දරණ යෝජනාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ කාර්මික සේවා කාරක සභාව සඳහා පහත සඳහන් ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය
12. සංජය දයාරත්න මහතා, ඉංජිනේරු, නො. 62, දයා සෙවන, මීරිහෙලිය, අලව්ව
13. චාමික අමරදාස මහතා, ඉංජිනේරු, 97/2, ගොරොක්ගස්දෙණිය, අලව්ව
14. එස්.එම්.ටී.ඩී.ඩබ්.කේ. ගුණතිලක මහතා, විශ්‍රාමික, බණිජතෙල් නීතිගත සංස්ථාව නො. 397, 1 කණුව පන්සල ඉදිරිපිට, නාරම්මල පාර, අලව්ව

<u>කාර්මික සේවා කාරක සභාවට පැවරී ඇති බලතල -</u>

1. සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු සම්බන්ධ රු. 2,000,000.00 දක්වා වන ඇස්තමේන්තු අනුමත කිරීම
2. වෙනත් බාහිර ආයතන විසින් ප්‍රාදේශීය සභා විෂය පථයට අදාළ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු සම්බන්ධ රු. 2,000,000.00 දක්වා ව්‍යාපෘති සම්බන්ධ තීරණ ගැනීම
3. ක්‍රියාත්මක කරනු ලබන සියළු සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සලකා බැලීම
4. සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය තහවුරු කරගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ මහ සභාව වෙත ඉදිරිපත් කිරීම
5. මාර්ග සම්බන්ධ ගැටළු විසඳීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම
6. මහජන පැමිණිලි සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සලකා බැලීම
7. වාහන අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. එමෙන්ම කාර්මික සේවා කාරක සභාව සඳහා ඉහත ඉදිරිපත් කල සංයුතියට අමතරව ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් පරිදි පහත නම් ඇතුලත් කොට සංයුතිය සකස් කර සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඉහත සංශෝධන වලට යටත්ව එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ කාර්මික සේවා කාරක සභාව සඳහා ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා ඉහත සදහන් බලතල පැවරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(02-6) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/01– 06 දරණ යෝජනාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ පරිසර හා පොදු පහසුකම් කාරක සභාව සඳහා පහත සදහන් ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා පහත සදහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

1. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්‍ෂ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
12. එම්.ඒ.ජී.ජී.ආර්. සමීර රණතුංග මහතා, 471, පිලවතුර, මහරච්චිමුල්ල
13. ආර්.ඒ. උමේෂ් චින්තක ජයසිංහ මහතා, සංවර්ධන නිලධාරී, මලඇලවත්ත, ගලතරය, අලව්ව
14. ඩබ්.ඒ.ජී. වීරසේකර මහතා, ශ්‍රී ලංකා ගුරු සේවය (විශ්‍රාමික), නො. 338/3, දොඩම්කුඹුරවත්ත, අලව්ව
15. ජේ.එච්. කරුණා ජයමහ, විශ්‍රාමික ජොෂ්ඨ පරිපාලන නිලධාරී, නන්දන, පරමාඋල්ල, අලව්ව

**<u>පරිසර හා පොදු පහසුකම් කාරක සභාවට පැවරී ඇති බලතල -</u>**

1. බල ප්‍රදේශයේ පරිසර සංරක්ෂණය, මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය, සුසාන භූමි සංවර්ධනය, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය ආදී කාර්යන් සම්බන්ධයෙන් යෝජනා හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
2. බල ප්‍රදේශයේ පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම
3. පරිසර ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ ලබාදීම
4. ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල සහ සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවල සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අදාල අතුරු ව්‍යවස්ථාවලින් සභාවට බලය ලැබී ඇති කාර්ය පිළිබඳව නිරීක්ෂණය හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. එමෙන්ම පරිසර හා පොදු පහසුකම් කාරක සභාව සඳහා ඉහත ඉදිරිපත් කල සංයුතියට අමතරව ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් පරිදි පහත නම් ඇතුලත් කොට සංයුතිය සකස් කර සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඉහත සංශෝධන වලට යටත්ව එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ පරිසර හා පොදු පහසුකම් කාරක සභාව සඳහා ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා ඉහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(02-7)** **<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/01– 07 දරණ යෝජනාව</u>**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 178 වගන්තිය මගින් බලය ලැබී ඇති පරිදි 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ ටෙණ්ඩර් මණ්ඩලය / ප්‍රසම්පාදන කමිටුව සඳහා පහත සඳහන් ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා

**<u>ටෙණ්ඩර් මණ්ඩලය / ප්‍රසම්පාදන කමිටුවට පැවරී ඇති බලතල -</u>**

1. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම සඳහා නිර්දෙශ මහ සභාවට ඉදිරිපත් කිරීම
2. සභාව වෙත ලැබෙන ටෙන්ඩර් / ප්‍රසම්පාදන අයදුම්පත් විවෘතකිරීම සහ නිර්දේශ මහ සභාව වෙත ඉදිරිපත් කිරීම
3. විශේෂඥ උපදෙස් අවශ්‍ය වන කවර හෝ අවස්ථාවකදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම
4. ලංසු ඇගයීම් කමිටු නිර්දේශ අනුමත කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. එමෙන්ම ටෙණ්ඩර් මණ්ඩලය / ප්‍රසම්පාදන කමිටුව සඳහා ඉහත ඉදිරිපත් කල සංයුතියට අමතරව ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් පරිදි පහත නම් ඇතුලත් කොට සංයුතිය සකස් කර සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඉහත සංශෝධන වලට යටත්ව එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය හා 2015.08.31 දිනැති අංක 1930/6 දරණ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව 2025 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ ටෙණ්ඩර් මණ්ඩලය / ප්‍රසම්පාදන කමිටුව සඳහා ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මහජන නියෝජිතයින් පත්කිරීම හා ඉහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.ගරු සභාපතිතුමනි, ඉහත සංශෝධන වලට යටත්ව එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, කමිටු සම්බන්ධව දෙයක් කියන්න කැමතියි. කමිටු පත්කිරීමේදී ගරු සභාපතිතුමා නොමැති අවස්ථාවක අනිවාර්යයෙන් සෑම කමිටුවකම බලධාරියා වෙන්න ඕනේ ගරු උප සභාපතිතුමිය. ඔබතුමා යම් රැස්වීමක් සම්බන්ධයෙන් ආයතනයෙන් පිටව යන අවස්ථාවක පැහැදිලි කිරීමක් හෝ කරන්න අවශ්‍ය නිසා නිසා ගරු උප සභාපතිතුමියගේ නම සෑම කමිටුවකම මුලට තිබිය යුතුයි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ඒ කමිටු වලදී සභාපතිවරයෙක් පත්කරගැනීමේ බලය තිබෙනවා. ඒ නිසා තමයි හැමතැනටම ගරු උප සභාපතිතුමිය දාලා නැත්තේ. ඒ කමිටුව රැස්වෙලා එතනින් කෙනෙක්ව සභාපති විදියට පත් කරගැනීමේ බලය පනතෙන් පැවරිලා තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමා සමහර කමිටුවල නැති නිසා ඊළඟට බලය තිබෙන්නේ අපේ උප සභාපතිතුමියට. වගකීමක් දරන්න පුළුවන් කෙනෙක් අපේ කමිටුවල සිටිය යුතුයි. මන්ත්‍රීවරයෙක් ඒ වෙලාවේ පත් කරන එක ඇත්ත. නමුත් උප සභාපති ඉන්නවා නම් ඒ කාර්යය සම්බන්ධව කමිටු අවස්ථාවේදිම තීන්දුවක් ගන්න පුළුවන්. ඒකයි මම පැහැදිලි කරන්නේ. ගැටළුවක් නෑ. අපේ තිබුනු ක්‍රමවේදය තමයි පැහැදිලි කලේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අතුකෝරල මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව හොඳයි. නමුත් මේ පනතේ අර්ථ දක්වලා තිබෙනවා එදාට ඒ කාරක සභාවට නම් කරපු මන්ත්‍රී මණ්ඩලය අතරින් සභාපතිවරයෙක් තෝරාගන්න කියලා.

**(02-8) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/01– 08 දරණ යෝජනාව</u>**
1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව මගින් පිහිටවනු ලබන ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් දැරීමට බලය ලබාදී ඇති රු. 2,000,000.00 ක් දක්වා වන වියදම් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අනුමත කිරිම සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා වෙත බලය පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව මගින් පිහිටවනු ලබන ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් දැරීමට බලය ලබාදී ඇති රු.

2,000,000.00 ක් දක්වා වන වියදම් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අනුමත කිරිම සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපති වන පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා වෙත බලය පැවරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(02-9) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/01– 09 දරණ යෝජනාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් පැවරී ඇති කාර්යය, කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කිරිම සඳහා පහත සඳහන් පරිදි බලය පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | ප්‍රා.ස. පනතේ යොමුව | පවරා දෙනු ලබන බලය | බලය පැවරෙන අය |
|---|---|---|---|
| 1 | 9 (2) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පරිපාලන නිළධාරියා වශයෙන්, එකී පනතින් හෝ ඒ පනත යටතේ සාදන ලද රීති කිසිවක් මගින් හෝ තත් කාලයේ පවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ලේකම්වරයා වෙත පවරා ඇති නැතහොත් නියමකර ඇති බලතල ක්‍රියාවේ යෙදවීම, කාර්යයන් ඉටුකිරීම හෝ කර්තව්‍යන් කිරීම | ලේකම්, එම්.පී.සී. රේණුකා මහත්මිය |
| 2 | 216 | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2 (2) වන වගන්තියෙන් අලව්ව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල යටතේ<br>(අ). ප්‍රාදේශීය සභාවට එරෙහිව පවරනු ලබන නඩු කටයුතු වලදී සභාවේ අයිතිවාසිකම් වෙනුවෙන් විත්තිවාචක ඉදිරිපත් කිරීම, සහ ඒ කාර්යයේ දී සභාව වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරයාට හෝ නීතීඥවරුන්ට සභාව වෙනුවෙන් පෙනී සිටීමට බලය පැවරීමේ/ පත්කිරීමේ (Proxy/ Appointment - පෙරකලාසිය/ පත්කිරීම) අත්සන් කිරීම,<br><br>(ආ). අලව්ව ප්‍රාදේශීය සභාවට, ප්‍රාදේශීය සභා පනතෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් පැවරී ඇති කිසියම් බලතලයක් ක්‍රියාවට නැංවීමේ දී හෝ ක්‍රියාවට නැංවීම අවශ්‍ය යයි අදහස් කරනු ලබන විටක දී හෝ සභාවේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු කිසියම් අවස්ථාවක දී අධිකරණයේ නඩු පැවරීම අවශ්‍ය යයි අදහස් කරන යම් අවස්ථාවක දී යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට එරෙහිව කිසියම් අධිකරණයක නඩු පැවරීම සහ ඒ කාර්යයේ දී සභාව වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරයාට හෝ නීතීඥවරුන්ට සභාව වෙනුවෙන් පෙනී සිටීමට බලය පැවරීමේ / පත්කිරීමේ (Proxy / Appointment - පෙරකලාසිය / පත්කිරීම) අත්සන් කිරීම | ලේකම්, එම්.පී.සී. රේණුකා මහත්මිය |
| 3 | 133 වන වගන්තිය | අලව්ව ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පොදු ගිණුම, කර්මාන්ත ගිණුම සහ සේවක ණය ගිණුම යන ජංගම ගිණුම් තුනට අදාලව කරනු ලබන සියළුම ගෙවීම් වෙනුවෙන් චෙක්පත් හෝ අණකර සඳහා, | |
| | | පළමු අත්සන්කරු වශයෙන් අත්සන් කිරීම | ලේකම්, එම්.පී.සී. රේණුකා මහත්මිය |
| | | දෙවන අත්සන්කරු වශයෙන් අත්සන් කිරීම | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, බී.ආර්.ඒ.කේ. ගුණසේන මහත්මිය |
| | | දෙවන අත්සන්කරු නොමැති අවස්ථාවලදී චෙක්පත්වල දෙවන අත්සන්කරු වශයෙන් වශයෙන් අත්සන් කිරීම | කළමනාකරණ සේවා නිලධාරී, එන්.එම්.එස්. රණසිංහ මහත්මිය |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. ප්‍රාදේශීය සභාවක මහජන නියෝජිතයින් ලෙස අපි පත්වෙලා ආවත් මූල්‍ය කටයුතු පවත්වාගෙන යන්නේ රාජ්‍ය නිලධාරීන්. මෙතෙක් පැවති සෑම මහා සභාවකම බලය පැවරීම සාම්ප්‍රදායිකව කල දෙයක්.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් පැවරී ඇති කාර්යය, කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් පරිදි බලය පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

<u>**03. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම**</u>

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට තම තමන් නියෝජනය වන කණ්ඩායම අනුව යම් අදහසක් හෝ ස්තුතියක් පල කරන්න අවස්ථාවක් දෙන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, විශේෂ මහා සභාවක ඒ අවස්ථාවට යන්න අවකාශයක් නෑ. මේ අවස්ථාවේදී ඔබතුමා ගෙනා යෝජනා වලට තමයි ප්‍රමුඛස්ථානය දෙන්නේ. මහ සභාවේදී සියළු මන්ත්‍රීවරු බලාපොරොත්තු වෙනවා උදව් කරපු අයට ස්තුති කරන්න. ඒත් අපි ආරම්භයේදී ඒකට නොයා ඉමු. ඒත් ගරු මන්ත්‍රීතුමාලාගේ බහුතරයක් කැමති නම් ඒකට ගියාට ප්‍රශ්නයක් නෑ.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, අද දින අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 66 ක් තුල මහජන නියෝජිතයින් වශයෙන් අපි 26 දෙනෙක් මේ අවස්ථාවට සම්බන්ධ වීම පිළිබඳව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නේ ඉතාමත් සතුටින්. එහෙම නම් අපේ මහජනතාව වෙනුවෙන් අලව් පුරවරය ගොඩනගන්නට අපි හැමදෙනාම එකතු වෙමු. ගරු සභාපතිතුමන් ඇතුළු ඔබ සියළු දෙනාම එකතු වෙමින් මේ සඳහා අපි සහයෝගයෙන් කටයුතු කරමුයි කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මහජන ඡන්දයෙන් මේ අවස්ථාවට තෝරාපත් කරගත් අප සියළු දෙනා වෙනුවෙන් ජනතාව ලබාදුන් වරමට හිස නමා ගෞරව කරනවා. මේ මංගල සැසි වාරය තුලින් අනාගතයේ අලව් පුරවරය අපි බලාපොරොත්තු වන සංවර්ධනාත්මක, මානසික සුවය පිරි ජනතාවක් වගේම ආදරණීය දරුවන්ට ලස්සන අලව් පුරවරයක් ගොඩනගමු යි කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. සියළු දෙනාටම සුභ අනාගතයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මම මුලින්ම අපේ ගරු සභාපතිතුමාටත්, පත්වෙලා ඉන්න පක්ෂ විපක්ෂ ආදරණීය මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ඔබතුමාලාගේ දේශපාලන ගමනට සුභ පතනවා. විශේෂයෙන්ම අද දින මම ගල්ගමුව කොට්ඨාශයේ මගේ ආදරණීය ජනතාවට විශේෂ ස්තුතියක් ප්‍රකාශ කරන්න ඕනේ. එමෙන්ම මට මේ අවස්ථාව ලබා දුන් සමගි ජන බලවේගයේ සංවිධායකතුමාටත් ඒ වගේම මට මේ ආසනය පුරාවට වැඩ කරන්න අවස්ථාව ලබා දුන් කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දයාසිරි ජයසේකර මැතුතිමාටත් මගේ විශේෂ ස්තුතිය පුද කරනවා.

ගරු සභාපතිතුමනි, අද අපේ මංගල සභාව. අපි සහෝදරයෝ වගේ කටයුතු කරන්නේ. හැබැයි අපේ සභා සම්ප්‍රදායේ කවදාවත් නොවුනු වැඩක් එදා, 02 වෙනිදා සිද්ධ වුනා. මොකද මගේ දේශපාලන ජීවිතයේ තුන්වෙනි පාර තමයි මේ. ඒ වගේම අපේ ඉතිහාසයේ දැකලා තිබෙනවා හැම ප්‍රාදේශීය සභාවකම ආරම්භක දිනයේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සෑම දෙනාටම ආරාධනා කරලා එක තේ මේසයක ඉඳලා එක අම්මගේ දරුවෝ වගේ තමයි අපි වැඩකටයුතු ආරම්භ කරන්නේ. ඉතින් මම කණගාටු වෙනවා ඔබතුමා එක්ක අපි තරහා නෑ. නමුත් අපේ ආසනයේ නාරම්මල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා පුද්ගලිකව සියළුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරලා. ඇත්ත වශයෙන්ම අපි පාර්ලිමේන්තුව ගත්තත්, සම්ප්‍රදාය තමා හැමෝටම ආරාධනා කරලා තේ මේසයක් තියන එක. පළාත් සභාවෙත් එහෙමයි. ප්‍රාදේශීය සභා ඉතිහාසයේත්, මම ආව දවසේ ඉඳලා තිබුනා. නමුත් එහෙම නොවීම ගැන මම කණගාටු වෙනවා. ඒ වුනාට තරහක්, වෛරයක් නෑ. ඇත්තටම සත්භාවයෙන් කලා නම්, ඒ කටයුත්තට අපි 26 දෙනාටම ආරාධනා කලා නම්, ඒක විශාල ගෞරවයක් වෙනවා. නැත්නම්

සමහර වෙලාවට ජනතාව හිතන්න පුළුවන් විපක්ෂයට ආරාධනා කරලා ආවේ නෑ කියලා. ඒ නිසා ඒ ගැන මගේ කණගාටුව හා කලකිරීම ප්‍රකාශ කරනවා. අපි ලේකම්තුමියට දොස් කියන් නෑ. එතුමියට තීන්දු තීරණ ගන්න බෑ. අද ආණ්ඩු පක්ෂයට 13 දෙනෙක් ඉන්නවා. විපක්ෂයට 13 දෙනෙක් ඉන්නවා. ඉතින් මෙතන එහෙම සංයුතියක් තියෙන්නේ. අපේ එකම අරමුණ තමයි අපේ බල ප්‍රදේශයේ මිනිස්සු වෙනුවෙන් සේවයක් කරන එක. අපි හැම හොඳ කටයුත්තකදීම සහෝදරයෝ වගේ ඒවාට ඉදිරිපත් වෙනවා, උදව් කරනවා.

ගරු සභාපතිතුමා ඇතුළු අපේ ආදරණීය මන්ත්‍රිවරු සියළු දෙනාටම ඉතාමත් හොඳ දේශපාලන ගමනක් යන්න ප්‍රාර්ථනා කරමින්, එමෙන්ම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් සුභ අනාගතයක්, යහපතක් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

එදා, 02 වෙනිදා ඇත්තටම සිදුවුනේ මම වැඩ භාරගන්න කටයුත්ත. ඉතින් අපේ මන්ත්‍රීවරු හැමෝම සම්බන්ධ වුනා. ඇත්තටම මම කාටවත් මොන විදියකින්වත් කතා කරලා කීවේ නෑ. අද තමයි නීත්‍යානුකූලව සභාවේ කටයුතු පවත්වන පළමු දිනය. ඉතින් එතන සන්නිවේදන ප්‍රශ්නයකුත් වුනා තමයි. ඒකට සමාව භජනය කරනවා. අපි හැමෝම එදා හිටියනම් හොඳයි කියලා පිළිගන්නවා. එතන අඩුපාඩුවක් වුනා. පසුව හොයලා බලනකොට බල ප්‍රදේශයේ හැමතැනම එහෙම ඇවිල්ලත් නෑ. ඉතින් කොහොම වුනත් ඒ අඩුපාඩුව ඉදිරියේදී වෙන්න දෙන්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මංගල සභාව ලෙස ආරම්භ වුනත් අරුණ මන්ත්‍රීතුමා කීවා වගේ අපිට ආරාධනා නොකිරීම සම්බන්ධයෙන් ගැටළුවක් නෑ. නමුත් අපේ ගම්වල මන්ත්‍රීතුමන්ලාගේ පාක්ෂිකයෝ ඇවිත් තියනවා. එතකොට ඒ අය ගම්වලට ගිහින් කියලා තියෙන්නේ අපිට ආරාධනා කරලා තියෙනවා, නමුත් අපි ආවේ නෑ කියලා. එතකොට මිනිස්සු හිතනවා අපේ කුහක ගතියක් නිසා තමයි සහභාගී වෙලා නැත්තේ කියලා. ඉතින් ඒක තමයි අපිට වුන අඩුපාඩුව. මොකද ප්‍රදේශයෙන් තේරිලා පත් වී ආව මහජන නියෝජිතයන් හැටියට ඒ ගැන අපි වැඩිය හිතන්නේ නෑ. නමුත් ගම්වල ඇතුළේ කතා වෙනවා, මිනිස්සු ඡන්දෙ විතරක් දීලා නිහඬව හිටියට හැමතිස්සේම අපි ගැන බලාගෙන ඉන්නවා, මොනවද සභාවේ කරන්නේ, මොන විදියටද අපි කටයුතු කරන්නේ කියලා. ඒ දේවල් ගැන ජනතාව හැමතිස්සේම සෝදිසියෙන්, කල්පනාවෙන් ඉන්නේ. එතකොට වැරදි මත ඒ අයට ගියාම අපිත් යම් යම් අපහසුතාවලට පත්වෙනවා. මන් ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමාගෙන් අප බොහොම පරිස්සමින් කටයුතු කරමු. මම තුන්වෙනි සැරේට තමයි ප්‍රාදේශීය සභාවට තේරී පත්වෙලා ආවේ. අපි සුහදව සභාපතිතුමත් එක්ක කටයුතු කරපු අය. අපි සියළු දෙනා විශේෂයෙන්ම අපි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හැටියට පසුගිය සභාවල යම් යම් ප්‍රශ්න ඇතිවුණත්, අපිට එහෙම ප්‍රශ්න ඇති කර ගන්න කිසිම අවශ්‍යතාවයක් නෑ. මොකද දැන් රැල්ලක් විදිහට ඇවිල්ලා අද සභාව පිහිටන කොට අපිටත් සභාවට ආයෙත් ගොඩ වෙන්න අවස්ථාව ලැබීම අපේ භාග්‍යක්. ඒ වගේම අපේ ප්‍රදේශයේ ජනතාවටත් අපි යම්කිසි දෙයක් කළ යුතුයි කියන හැඟීමක් අපිට තියනවා. ඒ සියල්ලම හිතේ දරාගෙන හොඳ වැඩ සියල්ලටම ඔබතුමත් එක්ක ඉන්නවා, ඔබතුමාට සහාය දක්වනවා. යම් තැනක අපිට විවේචනයක් තියනවා නම්, ඒකත් නොබියව කොන්ද කෙලින් තියාගෙන කතා කරනවා. අපිට මේ ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් කරන්න ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබේවායි කියමින් මගේ කතාව අවසන් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒවගේම පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීවරුනි, ලේකම්තුමිය ඇතුළු සියළුම කාර්ය මණ්ඩල රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන් විශේෂයෙන් අද දිනයේ විශේෂ මහ සභා රැස්වීමට පැමිණීම සම්බන්ධවත්, ඒවගේම විශේෂ සභාව මෙහෙයවමින් අලව්ව ප්‍රාදේශීය සභාවේ අභිනව ප්‍රාදේශීය සභාවක් පිහිටුවීම වෙනුවෙන් හා අද දින මෙම කර්තව්‍යට සහභාගී වීම සම්බන්ධව ස්තූතිවන්ත වෙමින්, මා ඉතාමත්ම ගෞරවයෙන් සහ සුභ පැතුම් එක් කරනවා. ගරු සභාපතිතුමා අපිත් එක්ක හිටපු සමකාලීන මිත්‍රයෙක්. ඒවගේම දේශපාලනය තුළ අපි එකට කටයුතු කරපු අයෙක්. ඒ නිසා මන් හිතන්නේ ඔබතුමාත් අලව්වේ ඉපදිලා අලව්වේ පය ගහලා ඇලදොල, ගම හඳුනන පුද්ගලයෙක් විදිහට ඉදිරි අලව්වේ අනාගතය භාර අරගෙන මෙම

කර්තව්‍ය කරන්න පුළුවන් වෙයි කියලා අපේ විශ්වාසයක් තියනවා. පක්ෂ දේශපාලනය කෙසේ වෙතත්, පුද්ගලයෙක් විදිහට අපි ඔබ තුමාට ගරු කරනවා. ඔබතුමා ඉතාම චාම්, නිහතමානී ගතිගුණ තියෙන අයෙක් විදිහට එදා දක්වපු සහයෝගය අදත් දක්වයි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා අපිට පක්ෂ දේශපාලනයෙන් තොරව මේ අලව්ව ප්‍රාදේශීය සභාව ගොඩනගන්නට පුළුවන් නම්, මන් හිතන්නේ මේ ඉන්න මන්ත්‍රීවරු 25 දෙනාම ගරු සභාපතිතුමා සමඟ ඒකරාශී වෙනවා නම් මන් හිතන්නේ අලව්ව බල ප්‍රදේශයේ ඡන්දය දුන් අපේ සියළුම ජනතාවගේ අභිප්‍රායන් ඉෂ්ඨ වෙනවා කියන එක මා විශ්වාස කරනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලා කීවා වගේ ඔබතුමන්ලා ඕනේම අවස්ථාවකදී කරන හොඳ වැඩවලට එකහෙලාම අපි අත උස්සලා සහයෝගය ලබා දෙන්නටත්, ඒවගේම යම් වැරැද්දක් අඩුපාඩුවක් දැක්කොත් පෙන්වන්නට නොපසුබට නොවන බවත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම විශේෂයෙන් මෙතෙක් සභාවල පත් වූ මන්ත්‍රීවරු සේම, ඔබ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හා විපක්ෂයේ මන්ත්‍රීවරු එක්ක මේ කටයුතුදීලට ඉතාමත්ම සමඟියෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. යම් ප්‍රතිපාදන, සභාව සතු උපකරණ, යන්ත්‍ර සූත්‍ර නොයෙකුත් කටයුතුවලදී මෙන්ම ඒ මන්ත්‍රීවරුන්ටත් ප්‍රතිපාදන ලබා දීලා මේ කටයුත්ත සහයෝගයෙන් ඉදිරියට කරගෙන යමුයි කියලා මා යෝජනා කරන අතර, විශේෂයෙන් අද දිනයේදී මේ සභාව නියෝජනය කරන්නට මා හට අවස්ථාව ලැබුනා. අලව්ව ප්‍රාදේශීය සභා ඉතිහාසයේ ස්වාධීන කණ්ඩායමකින් තේරී පත්වෙලා ආපු මන්ත්‍රීවරයෙක් නෑ. ඒ නිසා මා ඇතුළු මගේ සහෝදර මන්ත්‍රීතුමා ස්වාධීන අපේක්ෂකයින් දෙදෙනෙක් විදිහට අපේ ප්‍රදේශයේ අලව්ව ප්‍රාදේශීය සභාවේ ජනතාව අපිව පත් කිරීම සම්බන්ධව මා මේ ගරු සභාවට ඒ අයට ඉතාමත්ම ගෞරවයක් ලෙස සිහිපත් කරනවා. ඒ ජනතාවගේ අභිලාෂයන්, කර්තව්‍යයන් වගකීම් අප දෙදෙනාගේ කර මතට වැටී තිබෙනවා. ඒ නිසා අප දෙදෙනා පත් කරලා එවපු ජනතාවට ස්තූතිවන්ත වෙමින්, ඔබ සියළු දෙනාටම සුභ දවසක් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බෙහෙවින් ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඒවගේම ගරු ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙනුත්, මාධ්‍යවේදී සරත් මහතාගෙනුත් අවසරයි. හැමෝටම සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ගමන්ම, විශේෂයෙන්ම සුභාසිංශන එක් කරනවා අලව්ව පුරවරය නගා සිටුවීමේ දැවැන්ත කාර්යය වෙනුවෙන් අද මේ සභාවට තේරී පත් වී ආව සියළුම සහෝදර මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ඒ වගේම අපිව මේ ගමන රැගෙන යන්නට ලොකු ශක්තියක් දරමින් අද අපේ මූලාසනාරූඪ වෙලා ඉන්න ගරු සභාපතිතුමාටත් සුභාශිංසන එක් කරන්න කැමතියි. ඒ වගේම දෙවන වතාවට තමා මා සභාව නියෝජනය කරන්නේ. ප්‍රථම වතාවේ අපේ හිටපු ආසන සංවිධායකතුමා, එක්සත් ජාතික පක්ෂයේ ගරු ශමල් සෙනරත් මැතිතුමත් මා මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමා තමයි මගේ දේශපාලන ගමනේ නායකයා. ඒවගේම දෙවන වතාවෙන් මම සමගි ජන බලවේගය පක්ෂයෙන් මේ අවස්ථාවට යොමු කළේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයෙන්, ගරු නිලන්ත හේරත් මැතිතුමාත් මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරන අතර, මම ගොඩක් බැහැ කිව්වා මේ ධූරය සඳහා ඉල්ලුම් කරන්න. නමුත් මගේ කොට්ඨාසයේ ජනතාව එක හඬින් ඉල්ලා සිටියා නැවත වතාවක් පෙනී සිටින්න කියලා. ඒ නිසා මේ මොහොතේ ඉතා ගෞරවයෙන් පරමාඋල්ල කොට්ඨාසයේ ඒ වගේම කැබැල්ලවිට, ගල්පොත්තේපොල, මිරිහෙලිය, පරමාඋල්ල සහ පල්ලේමෝරුගම යන ග්‍රාම නිලධාරී වසම්වල ඡන්දය දුන් සියළුම ජනතාවට මා මේ අවස්ථාවේදී හිස නමා ආචාර කරනවා. ඒවගේම පක්ෂ විපක්ෂ භේදයක් නැතුව අවශ්‍ය තැනට අවශ්‍ය දේ කරන හොඳ තීරණ ළඟදී මා එකහෙලාම නැඟී සිටින බව ප්‍රකාශ කරමින් සියළු දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒවගේම උප සභාපති තුමිය, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් තුමිය ඇතුළු සියළුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රී තුමියන්ලාගෙන් අවසරයි. 2025 අලව්ව ප්‍රාදේශීය සභාවේ නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් මංගල සැසිවාරය ආමන්ත්‍රණය කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපති තුමනි, මා අවස්ථාවක් කර ගන්නවා අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා සඳහා නවක මන්ත්‍රීවරුන්ගෙන් හා ජ්‍යෙෂ්ඨ දේශපාලනික වශයෙන් අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත මන්ත්‍රී මණ්ඩලයක් පත් කර ගැනීම සඳහා. ඒ වගේම අපිට ගෞරවනීය විදිහට මෙම සභාවේ වාඩි වීම සඳහා අවස්ථාව සලසා දීමට වෙහෙස මහන්සි වී කැපවීම් කරන ලද අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මැතිවරණ කොට්ඨාස 15 හි ග්‍රාම නිලධාරී වසම් 66 හි සියළුම ජනතාවට අපගේ හදපිරි ස්තුතිය පුද කර සිටිනවා. ඒවගේම තමා මැතිවරණ කාලසීමාව තුළ

ආරම්භයේ සිටම අවසානය දක්වා දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වී කටයුතු කරන ලද සියළුම රාජ්‍ය සේවකයින්ට මගේ හදපිරි ස්තුතිය අප සියළු දෙනාම වෙනුවෙන් පුද කර සිටිනවා. මැතිවරණය සාර්ථකව නිම කිරීම සඳහා විශාල කැප කිරීමක් කළා. එවගේම තමා මෙම මැතිවරණ කාලසීමාව තුල අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කිසිදු මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවක් හෝ මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් සිදු නොවන අයුරින්, බිමෙහි ආරක්ෂාව තහවුරු කරමින් මැතිවරණය සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කළ සියළුම ආරක්ෂක අංශයටත් සාමාජිකයින්ටත්, එවගේම මැතිවරණ කාල සීමාවේ රට තුල නොසිටියත් විදෙස්ගතව සිට , මැතිවරණය සඳහා ආශිර්වාද කරපු, නන් අයුරින් සහයෝගය ලබා දුන් විදෙස්ගතව සිටින සියළුම ශ්‍රී ලාංකිකයිටත් අපගේ හදපිරි ස්තුතිය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. ඇත්තටම අලව්ව ප්‍රාදේශීය ජනතාවගේ අභිමතය පරිදි ජනතාවගේ කැමැත්ත පරිදි ගරු සභාපතිතුමන් ඇතුළුව සභිකයින් 26 දෙනකු තෝරාපත් කරගෙන තිබෙනවා. ඉතින් මා හිතනවා අපි තේරී පත්වෙලා ඉන්න සියළුම සභිකයෝ තම පෞද්ගලික අභිමතාර්ථයන් වෙනුවෙන් පෞද්ගලික අවශ්‍යතා වෙනුවෙන් , මෙම ගරු සභාවේ වාඩි වී නැති බවත්, අලව්ව පුරවරයේ සහ ජනතාවගේ අභිවෘද්ධියත් වෙනුවෙන් පොදු හැඟීමෙන් යුතුව මෙම සභාවේ වාඩි වී සිටින්නේ කියලා විශ්වාසය තියනවා. අපි ඒ විශ්වාසය සුරකිමින් අලව්ව ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය උපරිම සහයෝගය ලබා දීමට මෙම සභාව තෝතැන්නක් කර ගනිමින්, ඔවුන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් පෙනී සිටීමට අපි ඉතාම සහයෝගයෙන් කටයුතු කරමුයි කියන ඉල්ලීම මා මේ අවස්ථාවේදී සිදු කරනවා.

ඒ වගේම තමා අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම්තුමිය ඇතුලු සමස්ත කාර්ය මණ්ඩලයම මේ තාක් කාලයක් ඉතාම සක්‍රිය අයුරින් අලව්ව ප්‍රදේශයේ ජනතාවට සහයෝගය ලබා දුන්නා. මින් ඉදිරියටත් අපි එම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සක්‍රීය දායකත්වය බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ඔබ අප සියළුදෙනා හමුවීමට අප ප්‍රදේශයේ යම් කිසි වැසියෙක් පැමිණෙන්නේ නම් ඔහුට තියන පෞද්ගලික ප්‍රශ්ණයක් හෝ පොදු ප්‍රශ්ණයක් අරගෙන තමයි. ඉතින් එම පුද්ගලයා මෙම ස්ථානයට පැමිණිලා ඒ පුද්ගලයාගේ ප්‍රශ්නය ඔබ වෙත ඉදිරිපත් කරායින් පස්සේ එම පුද්ගලයා මෙම ස්ථානයෙන් පිටව යන මොහොතේ දුක්මුසු මුහුණින් හෝ නැතිනම් කලකිරීමකින් හෝ පිටව නොවන විදිහට සාධනීය පිළිතුරක් ලබා දීමෙන් ඔවුන්ගේ දේශපාලඥයින් පිළිබඳ විශ්වාසය බිමෙහි තහවුරු කර ගැනීමට හැකියාව ලැබෙනවා. එවගේම තමා ප්‍රදේශය දියුණු කිරීමට ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට ඒක ලොකු සාධකයක් වෙනවා. ඉතින් එම නිසා ඒ කටයුතු සම්බන්ධයෙන් සිහිපත් කරමින් අදින් ආරම්භ කරන ලද අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වසරේ නව සැසිවාරය ඉදිරියට කරගෙන යාම සඳහා ගරු සභාපතිතුමාටත්, ගරු උප සභාපතිතුමියටත් එවගේම සියළුම මන්ත්‍රීතුමන්ලාටත් සියළු ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අප බලාපොරොත්තු වන ආකාරයට අලව්ව ප්‍රාදේශීය සභාව වෙනස්ම ගමනක් යන අවස්ථාවක්. ඉතින් ඒ නිසා එවැනි අවස්ථාවක අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් පත්වුණු ඔබතුමන්ට ප්‍රථමයෙන් සුභාශිංසන එක් කරනවා. මොකද අපි කුඩා කාලේ ඉදන් දන්න අපිත් සමඟ හැදුන, නගරයේ හිටපු ඔබතුමා වගේ පුද්ගලයෙක් වෙන පක්ෂයකින් හෝ අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් මේ අලව්ව නගරය දියුණු කිරීම සඳහා පත් කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ වගේම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න අවස්ථාව ලබා දුන්න, අපේ ස්වාධීන කණ්ඩායමේ නායකත්වය ගෙන කටයුතු කල අතුකෝරල මන්ත්‍රීතුමා, ඒ වගේම ඒ කණ්ඩායමට සහයෝගය දුන් අනිකුත් අපේ 28 දෙනාම මතක් කරන්න ඕනා. ඒ සියළු දෙනාගේම ශක්තියෙන් තමා මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නේ. එවගේම ඒ ප්‍රදේශයේ අප වෙනුවෙන් ඡන්දය පාවිච්චි කල, අප ගැන විශ්වාසය තැබූ සියළු දෙනාට අපගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න අවස්ථාවක් කර ගන්නවා.

එවගේම මම අලව්ව ප්‍රාදේශීය සභාව නියෝජනය කරන 04 වන අවස්ථාව. 1997 ලංකාවේ ලාබාලතම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා හැටියට අලව්ව ප්‍රාදේශීය සභාව (නාරම්මල) නියෝජනය කලා. ඊට පස්සේ පෞද්ගලික හේතුවක් මත 2005 වසරේ මා ඉල්ලුවේ නෑ. නමුත් 2010 වසරේ නැවත මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. එවගේම නැවත 2015 වසරේ මම අමාත්‍යවරයෙකුගේ ලේකම්වරයෙක් වශයෙන් කටයුතු කල නිසා අපි ගොඩනගපු පක්ෂයෙන් ප්‍රාදේශිය සභාව නියෝජනය කරන්න නොලැබුණත් ස්වාධීනව හෝ ජනතාව ඒ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් අද මම සතුටු වෙනවා. එවගේම ඉදිරි කාලය තුල

අලව්ව සම්බන්ධයෙන් අපිට විශාල වැඩ කොටසක් තියනවා. අලව්ව නගරයට ගියත්, පාරේ ගියත් අම්බලමක් වගේ, සභාවට ආවත් එහෙමමයි. සමාවෙන්න ඕනා එහෙම කියන්න වුනාට. මොකද 2010 වසරේ අපි අලව්ව ප්‍රාදේශීය සභාව ආරම්භ කරලා මේ ස්ථානයේදීම තීරණය කරා ගරු සභාපතිවරයාත්, මන්ත්‍රී මණ්ඩලයත් මේකේ අළුතින් ගොඩනැගිල්ලක් හදන්න සියළු කටයුතු සූදානම් කරනවා කියලා. මම හිතන්නේ ලක්ෂ ගානක් වියදම් කරලා ප්ලෑන් එකකුත් ඇන්දා. අද වෙනතුරුත් ඒ කටයුත්ත සිදු වුනේ නෑ. ඇත්තටම කවුරු මේකේ හිටියත් ඒ පිළිබද කණගාටු වෙනවා. අපි අනෙක් සභාවලට ගිහිල්ලා තියනවා. අපේ ආසන්නම සභාව නාරම්මල, අනෙක් පැත්තේ මීරිගම, මේ සභා දෙකට ගියත් කණගාටුවෙනවා මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු මේ ආකාරයෙන්ම කටයුතු කිරීම සම්බන්ධව. මම හිතන්නේ අපේ නවක මන්ත්‍රීවරුන්ටත් මේ අත්දැකීමම ගියොත් සභාව පිළිබඳව කිසිදු ගෞරවයක් ඇති වෙන්නෑ. අපේ පක්ෂය අදාල නෑ, අපි මෙතෙන්ට ආවනම් අපි සභිකයෝ. කවුරුත් අප ප්‍රදේශය වෙනුවෙන් වැඩ කරන්න ආපු පුද්ගලයෝ. හැබැයි අපි ගෞරවාන්විතව සේවයක් කරන්න ආපු පුද්ගලයෝ. අපිට ගෞරවාන්විතව සේවයක් කරන්න අවස්ථාව දෙන්න ඕනි. අපේ හිටපු විපක්ෂ නායකතුමා, මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා කීවා අපි මේ රැස්වීම්වලට එන්නේ මුදල් බලාගෙන නොවේ කියලා. ඇත්තටම ගරු සභාපතිතුමනි , මම හිතන්නේ මෙතන කිසි මන්ත්‍රීවරයෙකුට මේ දීමනාවෙන් ජීවත්වෙන්න බෑ. මේ රු. 20,000.00 කට ආසන්න ගානක දීමනාව ජීවත් වෙන්න පුලුවන් දිමනාවක් නොවේ. ඉස්සර කාලේ රු. 2,995.00යි. හැබැයි මේක පෙට්‍රල් ටිකක් ගහගෙන හරි මහජනතාවට සේවයක් කරන්න තිබ්ච්ච අවස්ථාවක්. අපි කොයි පක්ෂයේ හිටියත්, ඇත්තටම අපිට අන්තිමට ඉතිරි වෙන්නේ අපි කරපු දේට ගෞරවය විතරයි. මට මතක් වෙනවා අපේ පළවෙනි සභාපතිවරිය පද්මා වැත්තෑව මැතිණිය. අද ඇය මේ ස්ථානයේ නෑ. එතුමිය ගෙදර ඉන්නවා. රත්නායක මැතිතුමා ගොවිතැන් කරනවා. ඊලග සභාපති සුමිත් රාජපක්ෂ මැතිතුමා අද ගෙදරට වෙලා ඉන්නවා. ඒවගේ සභාපතිවරු බිහි වුනා. ඒ අය හිටියා. සන්ධ්‍යා කුමාර මැතිතුමා නැතිවම ගියා. ඉතින් ඒ වගේ සියළුම දෙනා යම් කිසි කැප කිරීමක් සේවයක් කරා. හැබැයි අද වෙනකොට ඔවුන්ට ගරුත්වයක් නෑ. හිටපු සභාපති ගාමිණී ගුණදාස මැතිතුමා මිය ගියා. ඔබතුමා එතැන හිටියා. අවමංගල්‍යය මෙහෙව්වා.

නමුත් අනිත් අයට ඒ ගෞරවයත් නැති වුනා. ඒ නිසා කාටත් ඒක පොදු දෙයක්. මේකෙන් ගියාට පස්සේ ඒ ගෞරවයවත් කිසිම දෙයක් ලැබෙන්නේ නැහැ. අපි කොයි පක්ෂයේ කොතැන හිටියත් තව අවුරුදු 05 කින් අපි ඉවරයි. ඒක නිසා මේකේ හිටියොත් ආයේ මන්ත්‍රීතුමා කියයි. පාරෙදි හම්බවුනොත් කතා කරන්නේවත් නෑ. ඒක තමා පරම සත්‍යය. ඒක නිසා ඒ ගැන අවබෝධයෙන් අපි අලව්ව දියුණු කිරීම සදහා යම්කිසි වැඩපිළිවෙලක් කරමු. මේකෙන් අපි යනකොට අළුත් සභාවක් බිහිකරලා, සභාවේ ගෞරවය රැක ගන්න පුළුවන් ආකාරයට මේක ගොඩ නගමු කියන ඉල්ලීම කරමින්, නැවත වාරයක් අපිව මෙම ස්ථානයට එවීම සම්බන්ධව අපේ ප්‍රදේශයේ ජනතාවට, අලව්ව ප්‍රදේශයේ ජනතාවටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමියනි, සියළුම මන්ත්‍රීවරුනි, මම මේ සභාව නියෝජනය කරන්නේ මහරච්චිමුල්ල කොට්ඨාශයෙන් දෙවන වරට. මේ සභාවේ හිටපු මන්ත්‍රීවරු ගණනාවක් ඒ වගේම අළුත් මුහුණු ගණනාවක් ඉන්නවා. අපි සියළු දෙනා මෙතෙන්ට පැමිණිලා තියෙන්නේ අලව්ව පුරවරය දියුණු කිරීමටයි. අලව්ව ප්‍රදේශයෙන්ම සභාපතිවරයෙක් බිහිවෙලා, මේ නගරය සංවර්ධනය කරලා හොඳ නගරයක් බවට පත්කරන්න අවස්ථාව ලැබෙයි කියලා මම විශ්වාස කරනවා. එවගේම සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමා කීවා වගේ අපි නාරම්මල සභාවේ ඉන්නකොට විශාල ප්‍රාදේශීය සභාවක්. අර අම්බලමක් වගේ කීව කතාව ඇත්ත. අපිට ලොකු ගෞරවයක් තිබුණා. ඉදගෙන ඉන්න පුටුව, මේසේ පවා යම් ගාම්භීරත්වයක් තිබුණා. රු. 5,000.00 වැනි සුළු මුදලකින් මන්ත්‍රීවරු යම් සේවයක් කලා. අපි එහෙමයි ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කටයුතු කලේ. ඉතින් සියළු දෙනාම මෙතෙන්ට ඇවිල්ලා ඉන්නේ මේ ප්‍රදේශය දියුණු කරන්න. ඒ වගේම අපේ ගම් ප්‍රදේශය දියුණු කරන්න. මම සන්තෝෂ වෙනවා.

මහරච්චිමුල්ල කොට්ඨාශයෙන් අපේ සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා තේරී පත්වීම ගැන. අපි දෙන්නට එකතුවෙලා මහරච්චිමුල්ල කොට්ඨාශය දියුණු කරන්න පුළුවන්. ඒ වගේම අපි යොජනාවක් කලොත් ඒ යෝජනාව පැහැර හරින්න එපා. අපි මේ යෝජනාව කරන්නේ අපි වෙනුවෙන් නෙවේ අපේ මහජනතාව වෙනුවෙන්. මම වැඩිදුර කතා කරන්න අවශ්‍ය නෑ. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම නිලධාරී මණ්ඩලයටත් මගේ ස්තුතිය පුද කරමින් නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමිය, මන්ත්‍රීවරුන්, මන්ත්‍රීතුමියන්ලා සියළු දෙනාගෙන්ම අවසරයි. මම දේශපාලනය කාලයක් කලත් ප්‍රථම වතාවට තමයි මන්ත්‍රීවරයෙක් වෙලා ආවේ. ඉතින් මේ පවතින ක්‍රමයට කොහොම හරි මටත් මන්ත්‍රීවරයෙන් වෙන්න අවස්ථාව උදා වුනා. මේ ක්‍රමවේදය නිසා මන්ත්‍රීවරයෙක් හැටියට සමාජයට සේවය කරන්න මට එන්න ලැබුනා. ඉතින් අපේ ගරු සභාපතිතුමා පොඩි කාලේ ඉදන් අඳුනනවා. අපි දෙන්නා, එතකොට මෙතන ඉන්න සියළු දෙනා හොඳ යාළුවෝ වගේම ගොඩක් හඳුනන අය. ඉතින් මේ හැම දෙනාම එක්ව හොද ගමනක් යන්න මෙතුමාට හොද ප්‍රාදේශීය සභාවක් හම්බවුනා කියලා මම දකිනවා. මොකද මෙතෙක් කාලෙකට ලැබුණ ප්‍රාදේශීය සභාවල කොට්ඨාශයකට මන්ත්‍රීවරු දෙන්නෙක් එක්ව හමුවුනේ නෑ. මම හිතන්නේ මේ වෙලාවේ එහෙම හමුවෙලා තියනවා. ඔබතුමාට බලය වැඩිය තියනවා. මගේ කොට්ඨාශය ගත්තොත් සිසිර මන්ත්‍රීතුමාත් ඉන්නවා. අපි දෙන්නට ස්වාධීනව කටයුතු කරන්න පුලුවන් පරිසරයක් හදලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

එමෙන්ම මෙතන ඉන්න සියළුදෙනාගේම අත්දැකීම් ටික අපිට බෙදා ගන්න, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඒක කරාවි. මට හිතෙන්නේ අපේ නවක මන්ත්‍රීතුමියන්ලාත් කිහිප දෙනෙක් ඉන්නවා. එතකොට අපේ ගුරුතුමිය තමයි අද උප සභාපතිනිය වෙලා ඉන්නේ. ඒකටත් මට සන්තෝෂයි. එවගේම මට මෙතෙන්ට එන්න මහගෙදර උන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එක්ව කටයුතු කරන පොදුජන එක්සත් පෙරමුණෙන් තමයි මට අවස්ථාව ලැබුණේ. එතකොට මම අලව්ව ප්‍රාදේශීය සභාවට එකම මන්ත්‍රීවරයා හැටියට පත් වෙනවා. මට ඒකට නවතල්වත්ත, හෙනහුන්දෙණිය, පල්ලේකැකුලාවල, හබරලගස්හින්න, වේදෙණිය, හෙට්ටිගෙදර, බෝගහවත්ත, ඕබඩගෙදර, කණමීවල , ගල්දෙණිය කියන මේ ප්‍රදේශ සියල්ලන්ගේම ඡන්දය ලබාදුන් සියළුදෙනාටම මාගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා. ඒවගේම අපි තව අවුරුදු 04 ක් හෝ 05 ක කාලයක් ඔබතුමා එක්ක ඉන්නවා. එතකොට මේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාගෙම සහයෝගය අප සියළු දෙනා බලාපොරොත්තු වෙනවා. ඒක ලැබෙයි කියලා හිතනවා. එතුමියලටත් අපේ ස්තුතියත්, මගේ පුද්ගලික ස්තුතියත් පක්ෂය වෙනුවෙන් ලබා දෙනවා. මට මේ තැනට එන්න අපේ දඹදෙණි ආසනයේ සංවිධායක ගරු රෝහණ බස්නායක මැතිතුමා තමා අවස්ථාව ලබා දුන්නේ. එතුමාගේ හා පවුලේ අයට හා මාත් එක්ක තව මන්ත්‍රීවරු 15 දෙනෙක් හා ස්වාධීන කණ්ඩායමේ 15 දෙනෙක් හිටියා. ඒ සියළුදෙනාගේ උදව් උපකාර ඇතිව තමයි මෙතෙන්ට ආවේ. එතකොට මගේ හෘදයාංගම ස්තුතිය ඒ සියළුම මැතිවරණයට සහභාගී වූ සියළු දෙනාටත් රෝහණ බස්නායක මන්ත්‍රීතුමා ඇතුළු හිටපු පළාත් සභා මන්ත්‍රීවරු ඇතුළු පවුලේ සියළුම දෙනාට මාගේ අවංක ආදර ස්තුතිය පුද කර සිටිනවා. ඉතින් ගරු සභාපතිතුමනි, අතීතය අපට හරි සුන්දරයි. එදා ඔයයි, මායි දැකපු ඒ අලව්ව අදත් එහෙමයි. චූටි වෙනස්කම් ටිකක් තමයි තියෙන්නේ. ඔබට අවස්ථාව තියනවා. ගොඩනගන්න. ඒකට අප සියළුදෙනා එකට අත්වැල් බැදගෙන එනවා කියලා බලාපොරොත්තු වෙනවා. ඒකට ඔබ තුමාගේ හයිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන කීපය නවත්වනවා. ඔබ සියළු දෙනාටම සුභ දවසක් කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමියනි, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් හා සියළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුනි, ලේකම්තුමියනි, මම කන්දෙගෙදර කොට්ඨාශයේ නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් මෙවර තේරී පත් වුනේ. ඉතින් අපට ලොකු වගකීමක් තියනවා, අපි වපුරපු බීජයේ ඵලය නෙලා

ගන්න. ඒකට ඔබතුමාගේ හයිය ඕනැ. මම හිතන්නේ මට මහත් ශක්තියක් වෙයි මාත් එක්ක තරඟ කල උද්ධාල ගරු මන්ත්‍රීතුමනි, ඔබ තුමාගේ හයියක් අරගෙන අපේ ඒ වපුරපු බීජයේ ඵලය අප හරි ආකාරව නෙලා ගත්තොත් අපිට ඉස්සරහට ගමනක් තියෙයි කියලා මං විශ්වාස කරනවා. ඒ හින්දා අපි හැමවලොවේම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ක්‍රියාවට නංවලා කටයුතු කරලා සමාජයට යහපතක් වෙන විදිහට කටයුතු කරමු කියන ඉල්ලීම කරමින් ඔබතුමාගේ ආදරණීය සහයෝගය ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි , සියළු දෙනාටම සුභ දවසක් කියලා ප්‍රාර්ථනා කරනවා. මුලින්ම අභිනවයෙන් තේරී පත්වුණු ගරු සභාපති, ධූරන්දර, අපේ හිතමිත්‍ර, අජිත් පරණගමගේ මැතිතුමාට මාගේ ගෞරවනීය ස්තූතිය, සුභාශිංසන එක් කරනවා. මම හා ඔබ තුමා අතරේ දිර්ඝ දේශපාලන සම්බන්ධයක් තිබුණට දේශපාලන මතවාද 02 ක අපි හිටියට අජිත් පරණගමගේ කියන සහෝදරයා, මන්ත්‍රීවරයා එහෙම නැත්නම් අපේ අභිනව සභාපතිවරයා ගත්තම නියම මිනිසෙක් විදිහට ඇසුරු කරන්න පුලුවන් හොඳ සහෝදරත්වයේ මන්ත්‍රීවරයෙක් විදිහට හඳුනාගත්තා. අපිත් එක්ක තේරී පත් වී දැවැන්ත සටන්වලට නායකත්වය දුන්, අපිත් එක්ක ඒකරාශී වෙලා මේ සභාවේ වෙන අසාධාරණකම්වලට අපිත් එක්ක හිටගත්ත මන්ත්‍රීවරයෙක් තමයි සභාපති වෙලා ඉන්නේ. ඒ හින්දා මන්ත්‍රීවරු පිළිබඳව අළුතෙන් දුක් ගැහැට කියලා දෙන්න ඕනැ නෑ. ඒ හින්දා දැනට මේ සභාවේ කියවෙනවා දැක්කා නවක මන්ත්‍රීවරු අපිටත් වැඩක් කරන්න අවස්ථාව දෙන්න කියලා. ඔතන තමයි අර්බුදයේ මුල. මේක ආරම්භ වෙන්නේ ඔතනින්. ඊලග සභාව එනකොට යම් යම් මතවාද හැදිලා. යම් යම් ගැටළුවකට ගිහිල්ලා. ඊට පස්සේ අපිට වැඩක් කරන්න බැ. ඔක තමයි සභාවක තියෙන ස්වභාවය. ඉතින් ඒ ස්වභාවය ඉස්සරහට උද්දමනය වෙනවා. ඒ කෙසේ වුනත් ඔබතුමා එවැනි තත්වයක් ඇති නොවන්න, හොඳ වපසරියක් ඇතිව හොඳ සටන්වලට නායකත්වය දුන්න විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට අපිත් එක්ක හොදට කටයුතු කරලා ඒ සභාපතිවරුන්ගේ බලයත් එක්ක පීඩාවට පත්වෙච්ච මන්ත්‍රීවරයෙක් හැටියට මං හිතනවා මන්ත්‍රීවරු 26 දෙනාට එහෙම තත්ත්වයක් උදා නොවෙයි කියලා. පක්ෂ පාට භේදයක් නැතිව පොදු අරමුණකට ඇවිල්ලා අලව්ව ප්‍රාදේශීය සභාව කොහොමද ඉස්සරහට ගේන්නේ කියලා තැනක හිටගනී කියලා මගේ ලොකු විශ්වාසයක් තියනවා. ඒ හින්දා මම ඔබතුමාට සුභාශිංෂන එක් කරනවා වගේම හොඳ මිනිසෙක් හැටියට ඇසුරු කරන්න පුළුවන් පුද්ගලයෙක් හැටියට ඔබතුමා ප්‍රධාන පුටුවේ ඉඳගෙන ඉදීම පිළිබඳව මම බොහොම සන්තෝෂ වෙනවා.. ඊලගට මගේ ප්‍රදේශයේ, වඩුවාව කොට්ඨාශයේ දේශපාලනය කියන්නේ අභියෝගයක්. අභියෝගයක් නැති දේශපාලනයක් නෑ. විවිධ මත දරණ අය ඉන්නවා. මට විතරක් වඩුවාව කොට්ඨාසයේ තනිව ඡන්දය ඉල්ලන්න හම්බවෙන්නේ නෑ. එහෙම මැතිවරණ නීතියක් නෑ. ඒ හින්දා කවුරුහරි ප්‍රතිවාදියෙක් තරඟ කරනවා. ඒ කාලේ මතවාද ඇති වෙනවා. මතවාදයක් එක්ක යම් යම් විරසක වීම් ඉදිරියටම අරගෙන යනවා. සමහර අය දේශපාලනය ඊට පසුවදාම අවසන් කරලා දානවා. සමහරු වෛරයක් බවට පරිවර්තන කරමින් යනවා. ඉතින් ඒ හින්දා වඩුවාව කොට්ටාශයේ මා වෙනුවෙන් අපේ පක්ෂයක් හැටියට විශාල ප්‍රමාණයක් ඡන්ද දීලා කුරුණෑගල දිස්ත්‍රික්කය ඇතුලත වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් මන්ත්‍රීවරයා ලෙස මාව පත් කිරීම පිළිබඳව එම ප්‍රදේශයේ ජනතාවට මාගේ ආචාරය, ප්‍රණාමය හා ගෞරවය මා මුලින්ම පුද කරනවා. ඒ මිනිස්සු ඒ ප්‍රදේශයේ වැඩ කෙරුවට, ඒ මිනිස්සුන්ට සහයෝගය දුන්නට අති දැවැන්ත සංවර්ධනයක් ඒ ප්‍රදේශයට අරගෙන ගියාට අපේ ජීවිත කාලයම සමාජ සේවය වෙනුවෙන් කැප කලාට ඒ මිනිස්සු මාව තනි නොකර ආරක්ෂා කර ගත්තාය කියන සංතෝෂයක් උපරිමයෙන් මට තියනවා. එවගේම අපිත් එක්ක තරඟ කරපු සහෝදර මන්ත්‍රීවරු ගණනාවක් හිටියා, අපේක්ෂක මහත්වරු ගණනාවක් හිටියා. ඒ හැම කෙනාම හැම වෙලේම සහෝදරත්වය, මිත්‍රත්වය අරක්ෂා කරගෙන ගැටළුවලට යන්නේ නැතිව මැතිවරණයෙන් පසුව එකට කටයුතු කරන්න ඕනැයි කියන පදනම තුල ඉඳගෙන තමයි හැම මොහොතකම මගේ දේශපාලන ව්‍යාපාරය මම අරගෙන ගියේ. ඉතින් එහෙම අරගෙන ගියාම සමහර අයට පේනවා ඒක වැරදි විදිහට. ඡන්දය නොකරම හිටියනම්, අපි සංවිධානය නොකරම හිටියනම් තමයි ප්‍රතිවාදී අපේක්ෂයෝ බලාපොරොත්තු වන ක්‍රමය. ඒ වුණාට ඡන්දයක් කරනකොට එහෙම වෙන්නේ නෑ. ඉතින් අපේ කොට්ඨාශයේ එක්වෙලා තරඟ කල සියළු දෙනාටත් අපේ ගෞරවය එක් කරන ගමන් විශේෂයෙන් අපේ මන්ත්‍රීවරු 03 දෙනෙක් පොදුජන පෙරමුණට ලැබුණා. ඒකෙන් මැතිවරණ කොමසාරිස්තුමා තීරණය කලා කාන්තා නියෝජන 02 ක් ඇතුලත් කරන්න. යම් යම් මතවාදාත්මක, විවාදාත්මක කරුණු කාරණා තියනවා. ඒ පත් කිරීම සම්බන්ධව. ඒ කෙසේ වුවත්,

අපි ඒ මැතිවරණ නීතියට අනුකූල වෙලා, අවනත වෙලා, නීතියට ගරු කරලා අපි කාන්තා නියෝජන 02 ක් දානකොට දෙවන තැනට ඡන්ද අරගෙන තිබුනේ සිරිකුමාර සහෝදරයා. ඒ වුනාට එතුමට එම අවස්ථාව නැතිව යනවා. අජන්තා නීල කුමාරි මැතිතුමිය ඒ වෙනුවෙන් ලැයිස්තුවේ හිටියා. නම් කරන්න තීරණයක් අපිත් ගත්තා. අපේ නව මන්ත්‍රීතුමියක් ඒ වෙනකොට නම් කරලා තිබුණා. එතුමිය අද සහභාගී වෙලත් නෑ. ඉස්සරහට ඒක නිවැරදි කරගන්න උත්සහ කරනවා. මොකද සභාවක මන්ත්‍රීවරයෙක් හැටියට ආවහම සහභාගී වෙන්න ඕනෑ. එතුමිය ඒ පිළිබඳව අපිට දැනුම් දීමක් කරලා නෑ. මොකද තත්වය කියලා අපි සොයා බලා ඉදිරියට නිවැරදි කරන්න කටයුතු කරනවා. එතුමියටත් පක්ෂයක් හැටියට ඒ ප්‍රදේශයේ සුවිශේෂී ඡන්ද සංඛ්‍යාවක් දීලා තියනවා.

ඉතින් ඡන්දය ලබා දුන් සියළුම දෙනාට අපේ ගෞරවය, ආචාර ප්‍රණාමය පුද කරන ගමන් අභිනවයෙන් මෙතෙනට පත්වෙලා ආපු පරණ අය විශේෂ සංඛ්‍යාවක් ඉන්නවා, අත්දැකීම් තියන අය ඉන්නවා. අත්දැකීම් නොලබපු අය ඉන්නවා. මේ ජොෂ්ඨත්වයේ ඉන්න කිසිම කෙනෙක් අත්දැකීම් ලබා ගෙන ආපු අය නෙවේ. ඒ අයත් සභාවක නවකයෝ හැටියට ඇවිල්ලා පරිණත වෙලා හිටියේ. නවකයෝ හැටියට ඒ අයගේ හැසිරීම්, ඒ අයට ගරු කරලා , ඒ අය ගෙනියන අවබෝධය ලබා ගෙන මේ සභාවේ තියන නීති, අණ පනත්, රීති එක්ක හුරුවෙලා කටයුතු කරමින් තමයි අපිත් ඉගෙනගෙන ඇවිල්ලා පරිණතභාවයට පත්වෙලා තියෙන්නේ. ඒ හින්දා මේ සියළුදෙනාටම කියන්න තියෙන්නේ මැතිවරණය දිනාගත්ත එක නෙවේ දැන් තමයි මුහුදට බැහැලා පීනන වැඩකටයුත්ත තියෙන්නේ. එක එක්කෙනා දක්ෂ වුණාම ඊලග මැතිවරණයට එයි, නැති අය එළියට යයි. එහෙම තමයි මේ සභාවල හැමදාම සැදුම්ලන්නේ. ඒ හින්දා ඒ පිළිබඳව තමුන්නාන්සේලා හැම කෙනෙක්ම , නවක අයට කියන්නේ අත්දැකීම් ලබා ගෙන ඉස්සරහට එන්න. හැමදාම අපි ඉන්නේ නෑ, ඉන්නත් බෑ, ඒක ලෝක ධර්මතාවය. ඒ හින්දා ඔයගොල්ලෝ ඉගෙනගෙන මේ ප්‍රදේශයේ ජනතාවට යමක් කරන්න ශක්තිය ධෛර්යය එක් කරලා, සභාපතිතුමාට ආණ්ඩු බලය මෙහෙයවා, ඒ සභාවේ අනෙක් අයට අපෙත් සහයෝගය දීලා, අපෙත් තියන ප්‍රශ්න අපිත් එක්ක කතා කරලා, ඒවත් එක්ක සුහදව අපිටත් මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාගේ ශක්තිය එක් කරයි කියලා ලොකු විශ්වාසයක් තියනවා. සියළු දෙනාටම සුබ වේවා, ජය වේවා, සුබ අනාගතයක් කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ ගරු උප සභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තුතිය පල කරන අතර අද දිනට නියමිත විශේෂ මහා සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 11.45 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2025.06.12
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.